**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**මහ සභා රැස්වීම.**
**2022.08.18**

**සහභාගි වූ සභික නාමාවලිය :-**

01. ගරු සභාපති.ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ මහතා
02. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුනිල් ශාන්ත මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. සුජිත් ප්‍රේමලාල් මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රණී ඩී.එච්.සීතා පද්මණී මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් චන්ද්‍රරත්න කුරුකුල මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ජී. අනෝමා රෝෂිණී නිලන්ති මෙනවිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදුභාෂන මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්රිණී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. චන්ද්‍රසිරි මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. ජී. බ්‍රෙසිල් නුවන් කුමාර මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.නන්දසේන මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා

**සහභාගි නොවූ සභික නාමාවලිය :-**

නැත.

**සහභාගි වූ නිලධාරින් :-**

01.ලේකම් (වැ.බ) - එච්.එල්.ප්‍රේමදාස මයා.
02.සංවර්ධන නිලධාරී - ඩී.කේ.නිසංසලා මිය.

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022.08.18 දින පැවති මහ සභා රැස්වීමේ සංෂිප්ත වාර්තාවයි.**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 අගෝස්තු මස මහ සභා රැස්වීම ආරම්භ කිරීම සඳහා 2022.08.18 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්නා ලදි. ආගමික වතාවත් සිදු කිරීමෙන් හා ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමේ කථාව පවත්වන ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමාත් ගරු සභික මණ්ඩලයත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත් පිළිගැනීමෙන් අනතුරුව න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

## 01.පසුගිය මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

- 2022.07.19 වන දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි, 2022.07.19 වෙනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>

මෙම සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 ජූලි මස 19 වැනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## 02.ගරු සභාපතිතුමාගේ නිවේදන.

- 2022 වර්ෂයේ මැයි, ජුනි, ජූලි මාසයන් සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාව.
- ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව.
- රාජ්‍ය වියදම් පාලනයට අදාල භාණ්ඩාගාර ලේකම්වරයාගේ චක්‍ර ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජනාධිපති මාධ්‍ය නිවේදනය.

## 03.සංදේශ/පෙත්සම්/පැමිණිලි ඉදිරිපත් කිරිම.

**නැත.**

## 04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ.

**නැත.**

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා.

**05.01) 2023 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැණවීමට අදාලව සකස් කරන ලද ගැසට් නිවේදනය සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

2023 වර්ෂය සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව මගින් අය කරනු ලබන බදු හා ගාස්තු පැනවීමට අදාලව ගැසට් නිවේදනය සඳහාත්, එම නිවේදනය පළ කිරීම සඳහාත් මහ සභාවේ අනුමැතිය ඉල්ලා තිබෙනවා.එය පහත පරිදි මම ඉදිරිපත් කරනවා.

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට ව්‍යාපාර බද්ද පැනවීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තිය යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට පැවරි ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයේ අගෝස්තු මස 18 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදි යෝජනා අංක 01 (01) (I) යටතේ පහත සදහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්.සුරන්ත ජයලත් විරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.

2022 අගෝස්තු මස 25 වන දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනිම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ ව්‍යාපාරයක් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ අංක 01 1තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණයක අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

**උපලේඛණය - අංක 01**

| | I තීරුව | II තීරුව |
|---|---|---|
| අනු අං: | බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද රු:ශත |
| 01 | රු.6000.00 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 02 | රු.6000.00 ඉක්මවන නමුත් රු.12000.00 නොඉක්මවන විට | 90.00 |
| 03 | රු.12000.00 ඉක්මවන නමුත් රු.18750.00 නොඉක්මවන විට | 180.00 |
| 04 | රු.18750.00 ඉක්මවන නමුත් රු.75000.00 නොඉක්මවන විට | 360.00 |
| 05 | රු.75000.00 ඉක්මවන නමුත් රු.150000.00 නොඉක්මවන විට | 1200.00 |
| 06 | රු.150000.00 ඉක්මවන විට | 3000.00 |

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයේ අගෝස්තු මස 18 දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 01 (01) (II) යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.

2022 අගෝස්තු මස 25 වැනි දි
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර , එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උප ලේඛණයේ අංක 02 I කොටස - අන්තරාදායක ව්‍යාපාර II කොටස - අප්‍රසන්න ව්‍යාපාර, III කොටස - අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර යන උප ලේඛණ වල 1 තීරුවේ නිරූපිත ව්‍යාපාර සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් පරිශ්‍රයක් භාවිතා කිරීමට බලය දෙමින් 2023 වර්ෂයට නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එකී උප ලේඛණයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යයි යෝජනා කරන්නීය.

## උපලේඛණය - අංක 02

## I කොටස - අන්තරාදායක ව්‍යාපාර

| | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| අනු අං : | කර්මාන්තයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන අවස්ථාවක රු:ශත | වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවක රු:ශත | වාර්ෂික වටිනාකම රු.1,500.00 ඉක්මවන අවස්ථාවක රු: ශත |
| 01 | ලැගුම් හල් | 500.00 | 750.00 | 1,000.00 |
| 02 | හෝටල් | 500.00 | 750.00 | 1,000.00 |
| 03 | බත්කඩ/ ආපන ශාලා සහ තේ/ කෝපි කඩ | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | බේකරි | 500.00 | 750.00 | 1,000.00 |
| 05 | කිරි පට්ටි හා කිරි වෙළදාම | 500.00 | 750.00 | 1,000.00 |
| 06 | මාලු වෙළදාම | 500.00 | 750.00 | 1,000.00 |
| 07 | මස් වෙළදාම | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | අයිස් කර්මාන්ත ශාලා | 500.00 | 750.00 | 1,000.00 |
| 09 | සිසිල් බීම කර්මාන්ත ශාලා | 500.00 | 750.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | ලොන්ඩරි | 500.00 | 750.00 | 1,000.00 |
| 11 | ගව ගාල් | 500.00 | 750.00 | 1,000.00 |
| 12 | සාතන මඩු | 500.00 | 750.00 | 1,000.00 |
| 13 | කොණ්ඩා සැකසීම (සැලුන්හල් සහ බාබර් සාප්පු) | 500.00 | 750.00 | 1,000.00 |
| 14 | ගල් වල | 500.00 | 750.00 | 1,000.00 |
| 15 | වී මෝල් | 500.00 | 750.00 | 1000.00 |
| 16 | ගල් ඇඹරීම (මෝල) | 500.00 | 750.00 | 1,000.00 |
| 17 | හුණු නිපදවීම හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 18 | සබන් නිපදවීම | 500.00 | 750.00 | 1,000.00 |
| 19 | වැල්ඩින් වැඩපලවල් | 500.00 | 750.00 | 1,000.00 |

## II කොටස - අප්‍රසන්න ව්‍යාපාර

| | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| අනු අං: | කර්මාන්තයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම **රු.750.00** නොඉක්මවන අවස්ථාවක රු:ශත | වාර්ෂික වටිනාකම **රු.750.00** ඉක්මවන එහෙත් **රු.1,500.00** නොඉක්මවන අවස්ථාවක රු:ශත | වාර්ෂික වටිනාකම **රු.1,500.00** ඉක්මවන අවස්ථාවක රු: ශත |
| 01 | භෝජන ශාලාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 02 | නේවාසික පහසුකම් සහිත හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 03 | බැටරි චාජ් කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | රස කැවිලි හා බයිට් වර්ග නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 05 | සිරප් හෝ පළතුරු බීම සකස් කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 06 | කුලු බඩු හා විවිධ ආහාර පැකට් කර විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 07 | ශීත කළ මස්, මාළු අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | බිත්තර වෙළදාම | 500.00 | 750.00 | 1,000.00 |
| 09 | කිරි ආශ්‍රිත ආහාර නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 10 | රූපලාවන්‍යාගාරයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 11 | සත්ව ගොවිපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 12 | දන්ත ශල්‍යාගාරයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13 | ක්ෂණික ආහාර වර්ග නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 14 | මල් ශාලාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

## III කොටස - අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

| I තීරුව | II තීරුව |
|---|---|

| අනු අං: | කර්මාන්තයේ ස්වභාවය | රු.750.00 නොඉක්මවන අවස්ථාවක රු:ශත | රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවක රු:ශත | රු.1,500.00 ඉක්මවන අවස්ථාවක රු: ශත |
|---|---|---|---|---|
| 01 | ඇඹරුම් හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 02 | ගඩොල් නිපද වීම | 500.00 | 750.00 | 1,000.00 |
| 03 | හිස් බෝතල්, පරණ යකඩ මිලට ගැනීම | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | විසිරි පින්තාරු කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 05 | පොහොර වර්ග හා කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 06 | කොහු මෝල් | 500.00 | 750.00 | 1,000.00 |
| 07 | පරණ භාණ්ඩ මිලට ගැනීම හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | සේවා කිරීම් ස්ථාන පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | වාහන අලුත් වැඩියා කිරිමේ ස්ථාන පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තිය යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට පැවරි ඇති බලතල ප්‍රකාර 2022වර්ෂයේ අගෝස්තු මස 18 වැනි දින පවත්වන ලද මහා සභා රැස්විමේදි යෝජනා අංක 01 (01) (III) යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

## යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (I) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත ලැබි ඇති බලතල ප්‍රකාර ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක කරගෙන යනු ලබන පහත උපලේඛන අංක 03 හි 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ 11 වැනි තීරුවේ එක් එක් කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරුප තීරුවේ නිරූපිත ප්‍රමාණයට කර්මාන්ත බද්දක්, 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර එම බද්ද ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

**උප ලේඛණය අංක - 03**

| I තීරුව | II තීරුව |
|---|---|

| අනු අං: | කර්මාන්තයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන අවස්ථාවක රු:ශත | වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවක රු:ශත | වාර්ෂික වටිනාකම රු.1,500.00 ඉක්මවන අවස්ථාවක රු: ශත |
|---|---|---|---|---|
| 01 | පොල්තෙල් නිපද වීම | 500.00 | 750.00 | 1,000.00 |
| 02 | පැඟිරි තෙල් නිපදවීම | 500.00 | 750.00 | 1,000.00 |
| 03 | හඳුන්කූරු නිපද වීම | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | යාන්ත්‍රික නොවන වඩු කර්මාන්ත | 500.00 | 750.00 | 1,000.00 |
| 05 | පිත්තල භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1,000.00 |
| 06 | ඇදුම් මැසීම | 500.00 | 750.00 | 1,000.00 |
| 07 | ගඩොල් අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | විසිතුරු භාණ්ඩ නිපද වීම | 500.00 | 750.00 | 1,000.00 |
| 09 | ඡායාරූප ශාලා/ පින්තූර රාමු කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 10 | කොප්පරා මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 11 | සත්ව ආහාර නිපද වීම හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 12 | පා පැදි අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 13 | දැන්වීම් පුවරු/ බැනර්/ පෝස්ටර් සැකසීම | 500.00 | 750.00 | 1,000.00 |
| 14 | පාවහන් නිපද වීම හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 15 | විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 16 | ඔරලෝසු අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 17 | ලෝහ ලියවන පට්ටල් වැඩ | 500.00 | 750.00 | 1,000.00 |
| 18 | ගුවන් විදුලි/ රූපවාහිනි යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 19 | පරිඝනක කාර්යාලීය යන්ත්‍ර සූත්‍ර අලෙවිය හා අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 20 | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 21 | පැණි හා හකුරු නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 22 | ජංගම දුරකථන අලෙවිය හා අලුත්වැඩියා කිරීම/කාඩ්පත් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |

## ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව
## 2023 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳ ගාස්තු පැනවීම

1988.08.23 වැනි දින අංක 520/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කර ප්‍රකාශයට පත්කර ඇති ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වැනි අතුරු ව්‍යවස්ථාවේ 3 (උ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්.සුරන්ත ජයලත් විරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,

තුංකම.
2022 අගෝස්තු 25 වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

යෝජනාව

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේදී 1988.08.23 වැනි දින අංක 520/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කර ප්‍රකාශයට පත්කර ඇති ඇඹිලිපිටිය ප්‍රදේශීය සභාව විසින් වැළදගනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වැනි අතුරු ව්‍යවස්ථාවේ 3 (උ) වගන්තිය ප්‍රකාරව පහත උපලේඛන අංක 04 හි දැක්වෙන පරිදි ගාස්තු 2023 වර්ෂයට පනවා අයකිරීමට සුදුසු බවට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

**උපලේඛණය - අංක 04**

| අනු අං: | විස්තරය | ගාස්තුව රු:ශත | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| 01 | ඉටි රෙදි හෝ රෙදි වලින් නිමකළ ප්‍රචාරණ දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 25.00 | මාසයකට හෝ ඉන් කොටසක් සඳහා |
| 02 | ඩිජිටල් තාක්ෂණය මගින් නිමකළ ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 50.00 | මාසයකට හෝ ඉන් කොටසක් සඳහා |
| 03 | වානේ වලින් නිම කළ ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 100.00 | ලිත් වර්ෂයක් සඳහා |
| 04 | විදුලි තාක්ෂණය මගින් ක්‍රියාත්මක දැන්වීම් පුවරුවක් සඳහා | 3000.00 | ලිත් වර්ෂයක් සඳහා |

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාළව විනෝද බදු ආඥා පනත අනුව බදු පැනවීම**

1912 අංක 7 දරණ ප්‍රසිද්ධ රග දැක්වීම් හා සැණකෙලි පිළිබඳ **ආඥා** පනතේ 3 අ. (1) වගන්තියෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයේ අගෝස්තු මස 18 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදි යෝජනා අංක 01 (01) IV යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාවට වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්.සුරන්ත ජයලත් විරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.

2022 අගෝස්තු මස 25 වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය

යෝජනාව

1912 අංක 7 දරණ ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි පිළිබඳ **ආඥා** පනතේ 3 අ. (1) වගන්තිය පරිදි ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාර එකී පනතේ 3 අ.(1) අ, ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු අය කිරිමටත් එකී පණතේ ප්‍රසිද්ධ රඟ දැක්වීම් යන්නට එකී පනතේ දෙවන වගන්තියේ (අ),(ආ),(ඇ) යන උප වගන්තිවල සඳහන් වන රඟ දැක්වීම් හා සැණකෙළි අදාල වන බවත් යෝජනා කරන්නීය.

**උපලේඛණය අංක- 05**

අ. ප්‍රසිද්ධ නාට්‍යය නිරූපනයක් ද-රු.5000.00

ආ. සිනමා යන්ත්‍රයක්, මැජික් ලාම්පුවක් හෝ ඒ ආකාරයේ වෙනයම් උපකරණයක් චිත්‍ර මාර්ගයෙන් ප්‍රදර්ශනය කරනු ලබන චලන ප්‍රකාශයන්ද-රු.2500.00

ඇ. නැටුම්, ඉන්ද්‍රජාල, පිනුම් සැම බොක්සින් තරඟ, සර්කස්,විවිධ ප්‍රසංග හෝ වේදිකා මත කෙරෙන විනෝද ප්‍රසංගයන්ද-රු.10000.00

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව වරිපණම් බදු පැනවීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය (1) වන උප වගන්තිය යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට පැවරි ඇති බලතල ප්‍රකාර 2022 අගෝස්තු මස 18 වැනි දින පැවති මහ සභාවේ යෝජනා අංක 01 (01) V යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුරන්ත ජයලත් වීරසිංහ
සභාපති
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව
තුංකම.

2022 අගෝස්තු මස 25 වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

යෝජනාව

අ. 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව සබරගමුව පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පලාත් පාලන සහකාර කොමසාරිස් විසින් අනුමත කර ප්‍රකාශයට පත් කරන ලද ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද බල ප්‍රදේශ තුළ පිහිටි කුඹුරු ඉඩම් හැර සියළුම නිවාස වල ,ගොඩනැගිලි වල,ඉඩම් වල,ගෙපත් වල පෙර වර්ෂයේදී තක්සේරු කරන ලද තක්සේරුව 2023 වර්ෂය සඳහා එකී පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව පිළි ගැනීමටද,

ආ. එකී තක්සේරුව මත 1987 අංක 15 දරණ ප්‍රදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපල මත ඉහත කී වාර්ෂික වටිනාකමින් 5% ප්‍රතිශතයක් අය කිරීමටද

ඇ. 1987 අංක 15 දරණ ප්‍රදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වරිපනම් බද්ද 2023 වර්ෂයේ මාර්තු 31, ජූනි30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු තුළදී සමාන

වාරික හතරකින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවන ලෙස බද්දට යටත් වන සෑම පුද්ගලයෙකුටම නියම කිරීමටද,

ඇ. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (7) වන උප වගන්තියෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත කී වර්ෂයට අදාල සම්පූර්ණ වරිපණම් බදු මුදල 2023 වර්ෂයේ ජනවාරි 31 දින හෝ එදිනට පෙර ගෙවනු ලැබුව හොත් 10% ක වට්ටමක් ලබා දීමටද, කිසියම් කාර්තුවක බදු මුදල අදාල කාර්තුවේ පළමු මාසය ඇතුළත ගෙවනු ලබන අවස්ථාවක එකී කාර්තුවේ මුදලින් 5% වට්ටමක් ලබා දීමටද යෝජනා කරන්නීය.

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**

**2023 වාර්ෂික සේවා ගාස්තු පැනවීම**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයට සේවා ගාස්තු පැනවිම වෙනුවෙන් 2022 අගෝස්තු මස 18 දින පවත්වන ලද මහා සභා රැස්වීමේදි යෝජනා අංක 1 (1) VII යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්.සුරන්ත ජයලත් විරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.

2022 අගෝස්තු මස 25 වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

**යෝජනාව**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව මගින් පහත සඳහන් අංක 06 වැනි උපලේඛනයෙහි 1 වැනි තීරුවෙහි සඳහන් සේවා සැලසීම වෙනුවෙනුත් II වැනි තීරුවෙහි සඳහන් පරිදි 2023 වර්ෂය සඳහා සේවා ගාස්තු අය කරන බව ප්‍රාදේශීය සභාව විසින් යෝජනාව කරන්නීය.

**උපලේඛනය අංක 06**

| අ.අ | I වැනි තීරුව | II වැනි තීරුව |
|---|---|---|
| 01. | වීපීරේබා හා නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීමේ සේවා ගාස්තු | 2,000.00 |
| 02. | ආදාහනයක් සිදු කර ගැනීමේ සේවා ගාස්තු<br>❖ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත<br>❖ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත | <br>15,000.00<br>16,000.00 |
| 03. | ජල අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමේ සේවා ගාස්තු<br>විදුලි අනුකූලතා සහතිකයක් නිකුත් කිරිමේ සේවා ගාස්තු | 200.00<br>200.00 |
| 04. | ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීමේ සේවා ගාස්තු | 750.00 |
| 05. | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ පෝරම සේවා ගාස්තු | 500.00 |
| 06. | ජල නල එලීම සඳහා මාර්ග පළුදු කිරීම<br>01.කොන්ක්‍රීට් පාරක් අඩි 1 ක් පළලට පළුදු කිරීම සඳහා (මීටරයකට)<br>02.තාර පාරක් අඩි 1ක් පළලට පළුදු කිරීම සඳහා (මීටරයකට) | <br>1,650.00<br>1,150.00 |

| | | |
|---|---|---|
| | 03. බොරළු පාරක් අඩි 1ක් පළලට පළුදු කිරීම සඳහා (මීටරයකට) | 650.00 |
| | 04.තාර/කොන්ක්‍රීට් පාර යටින් විද නලයක් එලීම සඳහා (මීටරයකට) | 750.00 |
| | 05. මාර්ගයේ උරහිස අසලින් වලක් කැපීම සඳහා | 450.00 |
| 07. | පස්,වැලි,ගල් ප්‍රවාහනය සඳහා ප්‍රාදේශිය සභා මාර්ග භාවිතයේදි කියුබ් 1ක් සඳහා | 100.00 |
| 08. | සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම් හා කාලය දීර්ඝ කිරීම් සඳහා වන පෙරසැරි ගාස්තු | |

| සංවර්ධන කාර්යයේ ස්වභාවය | අයකළ යුතු ගාස්තු | |
|---|---|---|
| 01.ඉඩම් අනුබෙදුම් සඳහා | ඉඩමේ ප්‍රමාණය(ව.මි.) | පෙරසැරි ගාස්තු |
| | ව.මි.150-ව.මි.300 | කැබලි 1 ක් සඳහා රු.1000/- |
| | ව.මි.301-ව.මි.600 | කැබලි 1 ක් සඳහා රු.800 |
| | ව.මි.601-ව.මි.900 | කැබලි 1ක් සඳහා රු.600 |
| | ව.මි.900 ට වැඩි | කැබලි 1ක් සඳහා රු.500 |
| 2.මායිම් තාප්ප/රැඳවුම් බැම් ඉදිකිරිම | දික් මිටර් 1ක් සඳහා | රු.100/- |
| 3.සංනිවේදන කුළුණු/ඇන්ටනා කුළුණු/සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරිම | රු.40,000/- | |
| 4.ඉන්ධන පිරවුම්හල්/වාහන සේවා ස්ථාන /දුම් පරීක්ෂා කරන ස්ථාන | ව.මි. 1කට | රු.100/- |
| 5.දැන්වීම් පුවරු | i.ඩිජිටල් දැන්විම් පුවරු (ව.මි. 1කට) | රු.2,500/- |
| | ii.ඩිජිටල් නොවන දැන්වීම් පුවරු(ව.මි. 1 කට) | රු.1,500 |
| | iii.නාම පුවරු (ව.මි.1කට) | රු.500/- |
| | iv.මාර්ගයට ඉහළින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු(Gentries) ව.මි.1 කට | රු.1000/- |
| 6.කසල බැහැර කිරීම් අංගන/තාවකාලිකව රැස්කර තබන ස්ථාන/ කොම්පෝස්ට් අංගන/සෞඛ්‍යාරක්ෂිතව කසල යොදා ඉඩම් ගොඩකිරීම. | හෙක්.1දක්වා. | රු.25,000/- |
| | හෙක්.1ට වැඩි | රු25,000/-+ වැඩිවන සෑම හෙක් 1 කට හෝ ඉන් කොටසක් සඳහා රු.5,000/- බැගින් |

| 7.නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි | ගෙබිම් ප්‍රමානය(ව.මී) | නේවාසික(ව.මීටර් 1 කට | (ව.මීටර් 1 කට) | නේවාසික නොවන (ව.මීටර් 1 කට) |
|---|---|---|---|---|
| | | තනි පුද්ගල | මහල් නිවාස | |
| | ව.මී. 400 දක්වා | රු.20/- | රු.25/- | රු.25/- |
| | ව.මී401-1000 | රු.22/- | රු.27/- | රු.27/- |
| | ව.මී.1001- 1500 | රු.25/- | රු.30/- | රු.30/- |
| | ව.මී.1501-2000 | රු.25/- | රු.32/- | රු.32/- |
| | ව.මී.2000 ට වැඩි | වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු.2,000/- බැගින් | වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු.2,000/- බැගින් | වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු.2,000/- බැගින් |

| 8. වාණිජ පරමාර්ථයෙන් සිදු කරනු ලබන | වර්ග ප්‍රමාණය (ව.මී) | ගාස්තුව (රු) |
|---|---|---|
| i. පිහිනුම් තටාක (තටාකයේ ඩෙක් සමග) | ව.මී.300 දක්වා | 6000/- |
| | ව.මී.301-500 | 15000/- |
| ii. සූර්ය පැනල සඳහා වන ගාස්තු | ව.මී.501-1000 | 30000/- |
| | ව.මී. 1000 ට වැඩි | රු.30,000/-+ වැඩිවන සෑම ව.මී.100 හෝ ඉන් කොටසක් සඳහා 1000/- බැගින් |

| | |
|---|---|
| 9. i.අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩි වන සේ සිදුකරන වෙනස් කිරීම් හා එකතු කිරීම් | මුළු පෙරසැරි ගාස්තුවෙන් 25%+ වැඩි වන අමතර වර්ග ප්‍රමාණය සඳහා පෙරසැරි ගාස්තුව |
| ii.ගෙබිම් ප්‍රමාණය වෙනස් කිරිමක් නොමැතිව අනුමත සැලැස්ම තුළ සිදු කරනු ලබන වෙනස් කිරීම්. | මුල් අනුමැතියේදි ගෙවන ලද පෙරසැරි ගාස්තුවෙන් 25% |

| | | |
|---|---|---|
| 10.සංවර්ධන බලපත්‍රයක් වෙනත් පාර්ශවයකට පැවරිම. | | රු.25000/- |
| 11.සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරිම. | i. ව.මී1000 දක්වා | රු.5000/- |
| | ii ව.මී.1000 ට වැඩි | රු.10000/- |

| ආවරණ අනුමැතිය ලබාදීම සඳහා වන සේවා ගාස්තු (පෙරසැරි ගාස්තු වලට අමතරව) | | |
|---|---|---|
| සංවර්ධනයේ ස්වභාවය | අයකල යුතු ගාස්තු (බදු රහිත) | |
| 1.අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදුකරණ ලද ඉඩම් බෙදීමක් සඳහා | ඉඩම් කැබලි 1 ක් සඳහා රු.3000/- බැගින් | |
| 2.අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරිම/එකතු කිරිම්/නැවත ඉදිකිරිම්. | නේවාසික(ව.මි.1 කට) | නේවාසික නොවන(ව.මි. 1කට) |
| i.අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම දක්වා) | රු.200/- | රු.500/- |
| ii.වහල මට්ටම දක්වා ඉදිකිරිම් ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහලය හැර) | රු.300/- | රු.1,000/- |
| iii.වහලය සහිත බිත්ති ඉදිකිරීම් | රු.400/- | රු.1,500/- |
| iv.පදිංචිවිම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරිම. | රු.500/- | රු.2,000/- |
| v.මායිම් තාප්ප/ රැඳවුම් බිත්ති ඉදිකිරිම. | රු.200/- (දික් මීටරයක් සඳහා) | රු.500 (දික් මීටරයක් සඳහා |
| vi.විදුලි සංදේශ, සම්ප්‍රේෂණ සහ ඇන්ටෙනා කුළුණු ඉදිකිරිම. | බිම්පාදම ඉදිකිරිම රු.150,000/-<br>වහල මුදුන ඉදිකිරිම රු.100,000/- | |
| 3.අනුකූලතා සහතිකය (coco) ලබා නොගෙන පදිංචි වීම. | දිනකට රු.100/- | |
| 4.වාහන නැවැත්වීමේ ස්ථාන (පරිශ්‍රය තුළ ලබාදී නොමැති විට එක් එක් වාහන නැවැත්විමේ ඉඩ සඳහා සේවා ගාස්තුව | -රු.500,000/-<br>- රු.1,000,000/- | |
| i.ප්‍රාදේශීය සභා | සියලුම වාහන සඳහා - රු.250,000/- | |
| 5.රථ වාහන නැවැත්වීමේ ඉඩ වෙනත් භාවිතයන් සඳහා භාවිතා කිරිම. | එක ඉඩමක් සඳහා රපියල් 20,000/- ක් සහ අනුමත සැලැස්ම පරිදි වාහන නැවැත්විමට පරිවර්තනය වන තෙක් වසරකට 10% ක වර්ධකයක් සහිතව. | |

| අනුකූලතා සහතිකය නිකුත් කිරීම සඳහා ගාස්තු | | | | |
|---|---|---|---|---|
| සංවර්ධන කාර්යයේ ස්වභාවය | අය කළ යුතු ගාස්තු (බදු රහිත) | | | |
| 1.ඉඩම් අනු බෙදුම් කිරීම | එක් කැබැල්ලකට රු.1000/- | | | |
| | ගෙබිම් ප්‍රමාණය (ව.මී.) | නේවාසික | | නේවාසික නොවන |
| | | තනි පුද්ගල | මහල් නිවාස | |

| | | | | |
|---|---|---|---|---|
| 2.ගොඩනැගිලි ඉදිකිරිම | ව.මී.400 දක්වා | රු.4,000/- | රු.5,000/- | රු.5,000/- |
| | ව.මී.400 වැඩි | රු.4,000/- +,ව.මී 400 ට වැඩි වන සෑම ව.මී.1 ට හෝ ඉන් කොටසක් සඳහා රු.15/- බැගින් | රු.5,000/-+ ව.මී.400 ට වැඩිවන සෑම ව.මී.1ටම හෝ ඉන් කොටසක් සඳහා රු.20/- බැගින් | රු.5,000/-+ ව.මී.400 ට වැඩි වන සෑම ව.මී1ටම හෝ ඉන් කොටසක් සඳහා රු.25/- බැගින් |
| 3.සංනිවේදන කුළුණු,ඇන්ටෙනා කුළුණු/සම්ප්‍රේෂණ කුළුණු සඳහා | රු.5,000/- | | | |
| 4.මායිම් තාප්ප හා රුඳවුම් බැම් | දික් මීටර් 1 කට රු.25/- බැගින් | | | |
| 5.පොදු ගොඩනැගිලි සඳහා වන අනුකූලතා සහතිකය අළුත් කිරීම | රු.10,000/- | | | |

| භාවිතය වෙනස් කිරිම සඳහා සේවා ගාස්තු | | |
|---|---|---|
| | ගෙබිම ප්‍රමාණය (ව.මී) | ගාස්තුව (රුපියල්)(බදු රහිත) |
| පෙරසැරි ගාස්තු. | 45 දක්වා | 1,000/- |
| | 45- 90 | 1,500/- |
| | 91- 180 | 1,750/- |
| | 181- 270 | 2,000/- |
| | 271- 450 | 2,500/- |
| | 451 -675 | 2,750/- |
| | 676- 900 | 3,000/- |
| | 900 ට වැඩි | වර්ග මීටර් 900 ට වැඩිවන සෑම වර්ග මීටර් 90 ක් සඳහාම රු.500/- බැගින් |
| අවසර පත්‍රය සඳහා ගාස්තු<br>i.නේවාසික භාවිතයක් වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනීම. | වර්ග මීටරයක් සඳහා රු.750/- | |
| ii. නේවාසික නොවන අනිකුත් භාවිතයක් වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනීම. | වර්ග මීටරයක් සඳහා රු.500/- | |

## 08. පරිසර බලපත්‍ර ලබා ගැනීම - පරීක්ෂණ ගාස්තු

| මුදල් ආයෝජනය රු. | පරීක්ෂණ ගාස්තු රු: ශත |
|---|---|
| I. රු:250,000 ක් හෝ ඊට අඩු | 3,000.00 |
| II. රු:250,001 සිට රු:500,000 දක්වා | 3,750.00 |
| III. රු:500,001 සිට රු:1,000,000 දක්වා | 5,000.00 |
| IV. රු:1,000,000 වැඩි | 10,000.00 |

| | පරීක්ෂණ ගාස්තු රු: ශත |
|---|---|
| 10. පරිසර බලපත්‍රයතක් ලබා ගැනීමේ ගාස්තු | 4000. 00 |

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට සභාවට අයත් දේපල කුලියට දීමේ ගාස්තු අය කිරීම**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සදහා 2023 වර්ෂයට යන්ත්‍ර සූත්‍ර කුලියට දීමේ ගාස්තු පැනවීම වෙනුවෙන් 2022 වර්ෂයේ අගෝස්තු මස 18 පවත්වන ලද මහා සභා රැස්වීමේදි යෝජනා අංක 01 (1) VIII යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්.සුරන්ත ජයලත් විරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.
2022 අගෝස්තු මස 25 වැනි දින,
තුංකම ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය

යෝජනාව

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර සූත්‍ර කුලියට දිම වෙනුවෙන් මෙහි පහත උපලේඛනයේ අංක 07 1 වැනි තීරුවේ සඳහන් එක් එක් වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා අංක 11 තිරුවෙහි ගාස්තු 2023 වර්ෂය සදහා පනවා අය කළ යුතු බව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

**උපලේඛණය අංක - 07**

| අනු අංකය | I වන තීරුව විස්තර | II තීරුව ගාස්තුව (රුපියල්) |
|---|---|---|
| 01 | මෝටර්ග්‍රේඩරය | පැයකට - 3,000.00<br>(ඉන්ධන රහිතව) |
| 02 | බැකෝ යන්ත්‍රය | පැයකට - 2,000.00 (ඉන්ධන රහිතව) |
| 03 | ටිපර් රථය | පැය 08 ක දිනයකට - 4,000.00 (ඉන්ධන රහිතව) |
| 04 | ට්‍රැක්ටරය | දිනකට - 3000.00<br>(ඉන්ධන රහිතව) |
| 05 | ගලි බවුසරය | ව්‍යාපාර ඒකක - 5,000.00<br>ගෘහ ඒකක - 4,000.00<br>ප්‍රවාහනය සදහා කි.මී.1 ට රු:80 බැගින් ගෙවිය යුතුය. |
| 06 | ජල බවුසරය | දිනකට 1,000.00<br>ප්‍රවාහනය සදහා කි.මී.1 ට රු:80 බැගින් ගෙවිය යුතුය |
| 07. | ක්‍රීඩා පිටි හා සතිපොල | දේශපාලන රැස්වීම් සඳහා දිනකට - 3,000.00<br>සංගීත සංදර්ශන සඳහා දිනකට - 5,000.00<br>අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා දිනකට- 3,000.00 |

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව සංවර්ධනය නොකල ඉඩම් මත බදු පැනවීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තිය යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට පැවරි ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයේ අගෝස්තු මස 18 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදි යෝජනා අංක 01 (01) (VI) යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්.සුරන්ත ජයලත් විරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.

2022 අගෝස්තු මස 25වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 විධි විධාන ප්‍රකාරව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුල දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ප්‍රදේශ තුල පිහිටා ඇති පර්චස් 20 වැඩි සංවර්ධනය නොකල ඉඩම් වනවිට,

**අ.** එම ඉඩමේ කිසිදු ගොඩනැලිල්ලක් ඉදි කර නොමැති වූ විට හෝ

**ආ.** සැබැවින්ම ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමණය සමානුපාතය වශයෙන් 1.5 ක් විය යුතු බවටත්,

**ඇ.** ඒ ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් නොවන විට
ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 0.001% වන බද්ධක් 2022 වර්ෂය සඳහා පනවා අය කල යුතු බවටත් එම බද්දේ කාර්යය සඳහා1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 153 (1) ඇ ජේදය යටතේ යෝජනා කරන්නීය. විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීම යනු එක් එක් වගාවට අදාල රාජ්‍ය ආයතන විසින් ප්‍රකාශයට පත් කර ඇති වගාව වන්නේය.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසුයි කියල මා යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2023 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැණවීමට අදාලව සකස් කරන ලද ගැසට් නිවේදනය සඳහාත්,එම නිවේදනය පළ කිරීම සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවු බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.02) 2022 ජූලි මස 1,000,000.00 ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
2022 ජූලි මස මෙම සභාවේ ලක්ෂ 10ට වැඩි වියදම් 02ක් සිදු කරල තියෙනවා. එය විස්තර සහිතව පහතින් දක්වනවා. ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

| අනු අංකය | දිනය | වවුචර් අංකය | චෙක්පත් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | මුදල රු: |
|---|---|---|---|---|---|---|
| 01 | 2022.07.11 | 732 | 788049 | සුභද වැඩිහිටි සංවිධානය | කගගහවෙල 03 වන පටුමග......... | 1723906.10 |
| 02 | 2022.07.22 | 781 | 788071 සිට 788086 දක්වා | වැටුප් | කාර්ය මණ්ඩල වැටුප් (ස්ථිර) | 3445987.05 |
| එකතුව | | | | | | **5,169,893.15** |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 ජූලි මස රු:5,169,893.15 වූ ලක්ෂ 10ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.03) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් පල්ලෙබැද්ද ජල ව්‍යාපෘතියේ 2021 ජනවාරි මාසයට ප්‍රථම ජලය විසන්ධි කරන ලද ජල පාරිභෝගිකයින් 18 දෙනෙකුට අයත් රු:198002.00ක් වන අයකර ගත නොහැකි ජල ගාස්තු කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
මෙම ප්‍රාදේශීය සභාවට අයත් පල්ලෙබැද්ද ජල ව්‍යාපෘතියේ 2021 ජනවාරි මාසයට ප්‍රථම ජලය විසන්ධි කරන ලද ජල පාරිභෝගිකයින් 18 දෙනෙකුට අයත් රු:198,002.00ක් මුදලක් අයකර ගත නොහැකිව ලේඛණවල ඉදිරියට එනවා. ඒ පිළිබඳ විස්තර මෙහෙමයි.

| අනු අංකය | ජල අංකය | නම | හිඟ මුදල (රු.) | ජලය කපා හරින ලද කාල සීමාව |
|---|---|---|---|---|
| 1 | 07 | කමලානන්ද ජිනදාස | 10500.00 | 2022- දෙසැම්බර් |
| 2 | 10 | පී.එම්. හේනැග්ගෙ | 10 000.00 | 2019 - ජූනි |
| 3 | 12 | එම්.ආර්.එස්.ටී.පී. මස්ඉඹුල | 8250.00 | 2021 - ජනවාරි |
| 4 | 26 | ඩබ්.ඒ.හරමාරිස් | 13500.00 | 2021 - ජනවාරි |
| 5 | 29 | ආර්.බී.පුංචි මැණිකෙ | 4250.00 | 2020 - පෙබරවාරි |
| 6 | 40 | කේ.ජී.ධර්මදාස | 11750.00 | 2021 - ජනවාරි |
| 7 | 44 | එම්.එන්.ගුණපාල | 6750.00 | 2021 - ජනවාරි |
| 8 | 48 | එස්.කරුණාදාස | 12500.00 | 2021 - ජනවාරි |
| 9 | 49 | කේ.ජයසූරිය | 14018.00 | 2021 - ජනවාරි |
| 10 | 51 | පි.එම්.කේ.කුලසිරි | 13500.00 | 2021 - ජනවාරි |
| 11 | 94 | එම්.සී.එම්.මන්සූර් | 13000.00 | 2021 - ජනවාරි |
| 12 | 97 | එස්.තිලකරත්න | 10150.00 | 2021 - ජනවාරි |
| 13 | 92 | කේ.එම්.ඇසිලින් ජයතිස්ස | 4850.00 | 2021 - ජනවාරි |
| 14 | 102 | කේ.ජයසූරිය | 15750.00 | 2021 - ජනවාරි |
| 15 | 106 | කේ.ජී.ගුණතිලක | 12500.00 | 2021 - ජනවාරි |
| 16 | 126 | ජී.ඒ.පියසේන | 13250.00 | 2021 - ජනවාරි |
| 17 | 167 | ආර්.එල්.විරරත්න | 9734.00 | 2021 - ජනවාරි |
| 18 | 196 | පි.ඒ.අමරසේකර | 13750.00 | 2021 - ජනවාරි |
| | | **එකතුව** | **198,002.00** | |

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

මෙම හිඟ ශේෂය ලේඛණ තුලනය කිරීමේදී ලොකු ගැටළුවක්.මේ සම්බන්ධව නිතරම විගණනයෙනුත් විමසනවා. මෙම හිඟ මුදල් කොහොමවත් අය කරගන්න විදියක් නැහැ.ඔවුන්ට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග ගන්න අපි ඔවුන් සමග ගිවිසුම් ගතවෙලත් නැහැ.එම නිසා මෙම හිඟ ජල ගාස්තු කපා හැරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ගරු සභාපතිතුමණි,ජල පාරිභෝගිකයන් සමඟ ගිවිසුම් ගත නොවීම නම් ලොකු ගැටළුවක්.ඒ නිසා මම යෝජනා කරනවා මේ සභාව සතු ජල ව්‍යාපෘති තුනේම හැකි ඉක්මණින් ඔවුන් සමග ගිවිසුම් ගත වෙන්න කියලා.

**මේ පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත රත්නායක මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදි.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් පල්ලෙබැද්ද ජල ව්‍යාපෘතියේ 2021 ජනවාරි මාසයට ප්‍රථම ජලය විසන්ධි කරන ලද ජල පාරිභෝගිකයින් 18 දෙනෙකුට අයත් රු:198,002.00ක් වන අයකර ගත නොහැකි ජල ගාස්තුවලින්,එක් එක් ජල සම්බන්ධතාවයන්ට හිමි හිඟ මුදලින් 50% බැගින්, රු:99,001.00 ක මුදලක් කපා හැරීම සඳහාත්,හිඟ හේෂය රු:5000.00ට වැඩි සියළුම ජල සම්බන්ධතාවයන් විසන්ධි කිරීම සඳහාත් සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් පල්ලෙබැද්ද ජල ව්‍යාපෘතියේ 2021 ජනවාරි මාසයට ප්‍රථම ජලය විසන්ධි කරන ලද ජල පාරිභෝගිකයින් 18 දෙනෙකුට අයත් රු:198,002.00ක් වන අයකර ගත නොහැකි ජල ගාස්තුවලින්,එක් එක් ජල සම්බන්ධතාවයන්ට අයත් හිඟ මුදලින් 50% බැගින්, රු:99,001.00 ක මුදලක් කපා හැරීම සඳහාත්,හිඟ හේෂය රු:5000.00ට වැඩි සියළුම ජල සම්බන්ධතාවයන් විසන්ධි කිරීම සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.04) රටේ ඇතිවූ අර්බුධකාරී වාතාවරණය හමුවේ 2022 මැයි මස 9 වන දින හා 13 වන දින පල්ලෙබැද්ද සතිපොල වෙත වෙළෙඳුන්ගේ පැමිණීම ඉතා අඩු මට්ටමක පැවති අතර, එබැවින් එම දින දෙකට අදාල පල්ලෙබැද්ද සතිපොල සම්පූර්ණ වාරික මුදල කපා හැරීම සඳහාත්, 2022 මැයි මස පල්ලෙබැද්ද සතිපොලෙහි ඉතිරි වාරික මුදලින් 50% ක මුදලක් කපා හැරීම සඳහාත්, අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

රටේ ඇතිවූ අර්බුධකාරී වාතාවරණය හමුවේ 2022 මැයි මස 9 වන දින හා 13 වන දින පල්ලෙබැද්ද සතිපොල වෙත වෙළෙඳුන්ගේ පැමිණීම ඉතා අඩු මට්ටමක තමයි තිබුණේ. ඇත්තටම ඒ දින දෙකේ විතරක් නෙමෙයි මේ මාස කිහිපයේම සතිපොල වෙත වෙළෙන්දන්ගේ වගේම පාරිභෝගිකයන්ගේ පැමිණීමත් ගොඩක් අඩුයි.ඒ නිසා ඒ මාසයට අයත් සතිපොල ගාස්තු කපා හරින්න කියලා බදුකරු ඉල්ලීම් කරලා තියෙනවා. ඒ පිළිබඳ විස්තරය මෙහෙමයි.

| සතිපොලේ නම | මාසික වාරික මුදල (රු:) | එක් දිනකට අදාල වාරික මුදල (රු:) | කපා හැරීමට නියමිත මැයි මස ඉතිරි දින 06ට අයත් වාරික මුදලින් 50%ක මුදල (රු:) | 2022 මැයි මස කපා හැරීමට නියමිත සම්පූර්ණ මුදල (රු:) |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| පල්ලෙබැද්ද සතිපොල | 117,090.00 | 14636.25 | 43908.75 (14636.25x06 ÷ 02) | 73181.25 (29272.50+43908.75) |

- පල්ලෙබැද්ද සතිපොල සතියට දින 02 බැගින් මසකට දින 08ක් පැවැත්වේ.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඒ අනුව 2022 මැයි මස 9 වන දින හා 13 වන දින දෙකට අදාල පල්ලෙබැද්ද සතිපොලේ රුː 29,272.50ක් වන සම්පූර්ණ වාරික මුදල (14636.25 x 02) කපා හැරීම සඳහාත්, 2022 මැයි මස පල්ලෙබැද්ද සතිපොලෙහි ඉතිරි වාරික මුදලින්, 43,908. වන 50% ක මුදලක් කපා හැරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 මැයි මස 9 වන දින හා 13 වන දින දෙකට අදාලව පල්ලෙබැද්ද සතිපොලේ රුː 29,272.50ක් වන සම්පූර්ණ වාරික මුදල (14,636.25 x 02) කපා හැරීම සඳහාත්, 2022 මැයි මස පල්ලෙබැද්ද සතිපොලෙහි ඉතිරි වාරික මුදලින් 50% ක මුදලක් (43,908.75ක්) කපා හැරීම සඳහාත්, (2022 මැයි මස කපා හැරීමට නියමිත සම්පූර්ණ මුදල රුː73,181.25ක්) අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.05) පනාමුර, තුංකම, කොලඹගෙආර, 42 පදලංගල සතිපොලවල හා පල්ලෙබැද්ද කඩ කාමරයට අදාල 2022 මැයි හා ජුනි මාසයන්ට අදාල වාරික මුදලින් 50%ක මුදලක් කපා හැරීම සඳහාත්, 2022 ජූලි මස වාරික මුදලින් 75%ක මුදලක් කපා හැරීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

රටේ පවතින අර්බුධකාරී වාතාවරණය නිසා සතිපොල වෙත වෙළෙඳුන්ගේ වගේම පාරිභෝගිකයන්ගේ පැමිණීමත් ගොඩක් අඩුයි.ඒ නිසා සතිපොල ගාස්තු කපා හරින්න කියලා බදුකරුවන්ගෙන් දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් වෙනවා. ඇත්තටම ඒ ඉල්ලීම් අසාධාරණ නැහැ.ඒ අනුව පනාමුර, තුංකම, කොලඹගෙආර, 42 පදලංගල සතිපොලවල හා පල්ලෙබැද්ද කඩ කාමරයට අදාල 2022 මැයි හා ජුනි මාසයන්ට අදාල වාරික මුදලින් 50%ක මුදලක් සහ 2022 ජූලි මස වාරික මුදලින් 75%ක මුදලක් කපා හරින්න කියලා බදුකරුවන් ඉල්ලීම් කරල තියෙනවා. ඒ පිළිබඳ විස්තරය මෙහෙමයි.

| සතිපොලේ නම | මාසික වාරික මුදල රු. | කපා හැරීමට තීරණය කළ මැයි මස 50% මුදල (රුː) | කපා හැරීමට තීරණය කළ ජුනි මස 50% මුදල (රුː) | කපා හැරීමට තීරණය කළ ජූලි මස 75% මුදල (රුː) | කපා හැරීමට තීරණය කළ මාස 03ක සම්පූර්ණ වාරික මුදල (රුː) |
|---|---|---|---|---|---|
| තුංකම සතිපොල | 142,916.00 | 71,458.00 | 71,458.00 | 107,187.00 | 250,103.00 |
| පනාමුර සතිපොල | 186,250.00 | 93,125.00 | 93,125.00 | 139,687.50 | 325,937.50 |
| 42 පදලංගල සතිපොල | 38,355.00 | 19,177.50 | 19,177.50 | 28,766.25 | 67,121.25 |
| කොළඹගේආර සතිපොළ | 20,000.00 | 10,000.00 | 10,000.00 | 15,000.00 | 35,000.00 |
| පල්ලේබැද්ද කඩ | 6,666.00 | 3333.00 | 3333.00 | 4999.50 | 11665.50 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කාමරය | | | | | |
| එකතුව | **394,187.00** | **197,093.50** | **197,093.50** | **295,640.25** | **689,827.25** |

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් පනාමුර, තුංකම, කොලඹගෙආර, 42 පදලංගල සතිපොලවල හා පල්ලෙබැද්ද කඩ කාමරයට අදාල 2022 මැයි හා ජුනි මාසයන්ට අදාල වාරික මුදලින් 50%ක මුදලක් (394,187.00ක්) කපා හැරීම සඳහාත්, 2022 ජුලි මස වාරික මුදලින් 75%ක මුදලක් (295640.25ක්) කපා හැරීම සඳහාත් (2022 මැයි,ජුනි හා ජූලි මස කපා හැරීමට නියමිත සම්පූර්ණ මුදල රු:689827.25ක්) අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් පනාමුර, තුංකම, කොලඹගෙආර, 42 පදලංගල සතිපොලවල හා පල්ලෙබැද්ද කඩ කාමරයට අදාල 2022 මැයි හා ජුනි මාසයන්ට අදාල වාරික මුදලින් 50%ක මුදලක් (394,187.00ක්) කපා හැරීම සඳහාත්, 2022 ජුලි මස වාරික මුදලින් 75%ක මුදලක් (295,640.25ක්) කපා හැරීම සඳහාත් (2022 මැයි,ජුනි හා ජූලි මස කපා හැරීමට නියමිත සම්පූර්ණ මුදල රු:689,827.25ක්) අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.06) කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2021 අප්‍රේල් මස 27 වන දින සිට සැප්තැම්බර් 30 දක්වා මාස 05ක කාලයක් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු සතිපොල හා කඩ කාමර වසා තැබූ අතර එම කාල සීමාවට අදාල සම්පූර්ණ වාරික මුදල් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2021 අප්‍රේල් මස 27 වන දින සිට සැප්තැම්බර් 30 දක්වා මාස පහක කාලයක් මෙම සභාව සතු සතිපොල හා කඩ කාමර වසා තබන්නට සිදුවුණා.එම නිසා එම සතිපොල හා කඩ කාමරවලට අදාල බදු වාරික කපා හැරීම සඳහා යෝජනාවක් අපි 2021.05.18 දින මහ සභාවට ඉදිරිපත් කරලා, කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කළා.එහිදී නැවත සතිපොල විවෘත කරන දිනයක් දන්නෙ නැති නිසා එදා අපි තීරණය ගත්තේ "නැවත සතිපොල විවෘත කරන තුරු" කියලා.එහි මුදල හා කාල වකවානුව නිශ්චිත නොමැති නිසා එය නිශ්චිත කරලා තීරණයක් අරගෙන එවන්න කියලා, දන්වලා එවලා තියෙනවා.එම නිසා අපි එම තීරණය නැවත නිවැරදි විදියට ගත යුතුයි.ඒ අනුව එයට අදාල විස්තර මෙහෙමයි.

| සතිපොලේ නම | මාසික වාරික මුදල (රු.) | කපා හරින මාස ගණන | කපා හැරීමට තීරණය කළ මුදල (රු.) (මාස 05ක වාරික මුදල්) |
|---|---|---|---|
| පල්ලේබැද්ද සතිපොල | 107,333.00 | මාස 05 | 536,665.00 |
| උඩවලව සතිපොල | 39,510.00 | මාස 05 | 197,550.00 |
| තුංකම සතිපොල | 191,675.00 | මාස 05 | 958,375.00 |
| මුල්ඇඩියාවල සතිපොල | 99,908.00 | මාස 05 | 499,540.00 |
| පනාමුර සතිපොල | 229,229.00 | මාස 05 | 1,146,145.00 |
| 42 පදලංගල සතිපොල | 47,341.00 | මාස 05 | 236,705.00 |

| | | | |
|---|---|---|---|
| කොළඹගේආර සතිපොල | 35,975.00 | මාස 05 | 179,875.00 |
| පදලංගල කඩ කාමර අංක 01 | 500.00 | මාස 05 | 2,500.00 |
| පදලංගල කඩ කාමර අංක 02 | 500.00 | මාස 05 | 2,500.00 |
| පදලංගල කඩ කාමර අංක 03 | 500.00 | මාස 05 | 2,500.00 |
| පදලංගල කඩ කාමර අංක 04 | 500.00 | මාස 05 | 2,500.00 |
| පදලංගල කඩ කාමර අංක 05 | 500.00 | මාස 05 | 2,500.00 |
| **එකතුව** | **753,471.00** | | **3,767,355.00** |

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඒ අනුව 2021 අප්‍රේල් මස 27 වන දින සිට සැප්තැම්බර් 30 දක්වා මාස පහක කාලයකට අදාලව මෙම සභාව සතු සතිපොල හා කඩ කාමරවලට අයත් රු:3,767,355.00ක මුදල කපා හැරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2021 අප්‍රේල් මස 27 වන දින සිට සැප්තැම්බර් 30 දක්වා මාස 05ක කාලයක් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු සතිපොල හා කඩ කාමර වසා තැබූ අතර එම කාල සීමාවට අදාල රු:3,767,355.00ක මුදල කපා හැරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.07) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පරිගණක සඳහා දෘඪ තැටි (Hard Disk) 02ක් මිලදී ගැනීම සඳහාත්,ඒවා සවි කර අළුත්වැඩියා කිරීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මෙම ප්‍රාදේශීය සභාව සතු පරිගණක සඳහා දෘඪ තැටි (Hard Disk) 02ක් මිලදී ගැනීම සඳහාත්,ඒවා සවි කර අළුත්වැඩියා කිරීම සඳහාත් අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පරිගණක සඳහා දෘඪ තැටි (Hard Disk) 02ක් මිලදී ගැනීම සඳහාත්,ඒවා සවි කර අළුත්වැඩියා කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.08) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PF 7457 අංක දරණ කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PF 7457 අංක දරණ කැබ් රථයේ වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PF 7457 අංක දරණ කැබ් රථයේ වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.09) ජල භීතිකා මර්දන කටයුතු සඳහා සිරින්ජර් 500ක් හා ඉදිකටු 3000ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජල භීතිකා මර්දන කටයුතු සඳහා සිරින්ජර් 500ක් හා ඉදිකටු 3000ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ගරු සභාපතිතුමණි, ඉතා වැදගත් යෝජනාවක්.ජල භීතිකා අවධානම විතරක් නෙමෙයි අයාලේ යන සුනඛයන් නිසා රිය අනතුරුත් බහුලවම සිදු වෙනවා.කොළඹගෙආර ප්‍රදේශයේ ජනතාවට මේ අයාලේ යන සුනඛයන්ගෙන් හරිම කරදරයි.විශාල සුනඛයන් පිරිසක් ඉන්නවා.ඒ නිසා ගරු සභාපතිතුමණි,ඒ පිළිබඳවත් යම් වැඩ පිළිවෙලක් යොදන්න පුළුවන් නම් හොඳයි කියලා හිතෙනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජල භීතිකා මර්දන කටයුතු සඳහා සිරින්ජර් 500ක් හා ඉදිකටු 3000ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06. හදිසි යෝජනා**

**06.01) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු RD 7993 අංක දරණ ගලි බවුසරයට GPS සවි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු RD 7993 අංක දරණ ගලි බවුසරයට GPS සවි කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු RD 7993 අංක දරණ ගලි බවුසරයට GPS සවි කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.02) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගෙස්ටෙට්නර් රිකෝ 2501 MP මුද්‍රණ හා ඡායා පිටපත් යන්ත්‍රය අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගෙස්ටෙට්නර් රිකෝ 2501 MP මුද්‍රණ හා ඡායා පිටපත් යන්ත්‍රය අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගෙස්ටෙට්නර් රිකෝ 2501 MP මුද්‍රණ හා ඡායා පිටපත් යන්ත්‍රය අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.03) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු 96 ආදාහනාගාරයේ සේවා මුර කාලය දහවල් 12.00 සිට රාත්‍රී 9.00 දක්වා වෙනස් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු 96 ආදාහනාගාරයේ ආදාහන සිදු කිරීම ආරම්භ කරන්නේ සවස 02.00 සිට.මේ නිසා එහි සේවා මුර කාලය දහවල් 12.00 සිට රාත්‍රී 9.00 දක්වා වෙනස් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු 96 ආදාහනාගාරයේ සේවා මුර කාලය දහවල් 12.00 සිට රාත්‍රී 9.00 දක්වා වෙනස් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.04) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍රෝපකරණ හා රථවාහන අළුත්වැඩියා කිරීම හා අමතර කොටස් යෙදීම වෙනුවෙන් මේ දක්වා නිර්දේශ ලබාදුන් ලංකා ගමනාගමන මණ්ඩලයේ ඇඹිලිපිටිය ඩිපෝවේ කළමණාකරන ඉංජිනේරු පී.එල්.එම්.සී.අබේරත්න මහතා ස්ථාන මාරු ලබා ඇති බැවින්, 2022 ජූලි මස සිට එම ධුරයේ කටයුතු කරනු ලබන දිස්නක කස්තුරිආරච්චි මහතා වෙතින් එම නිර්දේශ ලබා ගැනීම සඳහාත්,ඒ වෙනුවෙන් එම මහතා වෙත ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහාත්,නිර්දේශයක් ලබාදීමට පෙර රු:500.00ක මුදලක් හා නිර්දේශ ලබාදීමෙන් පසු රු500.00ක මුදලක් ගෙවීම් කිරීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මෙම ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍රෝපකරණ හා රථවාහන අළුත්වැඩියා කිරීම හා අමතර කොටස් යෙදීම වෙනුවෙන් මේ දක්වා නිර්දේශ ලබාදුන් ලංකා ගමනාගමන මණ්ඩලයේ ඇඹිලිපිටිය ඩිපෝවේ කළමණාකරන ඉංජිනේරු පී.එල්.එම්.සී.අබේරත්න මහතා මේ වෙන කොට ස්ථාන මාරුවක් ලැබිල ගිහින්. 2022 ජූලි මස සිට එම ධුරයේ කටයුතු කරන්නේ දිස්නක කස්තුරිආරච්චි මහතා. ඒ මහතා වෙතින් එම නිර්දේශ ලබා ගැනීම සඳහාත්, නිර්දේශයක් ලබාදීමට පෙර රු:500.00ක මුදලක් හා නිර්දේශ ලබාදීමෙන් පසු රු500.00ක මුදලක් ඒ මහතා වෙත ගෙවීම් කිරීම සඳහාත් අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍රෝපකරණ හා රථවාහන අළුත්වැඩියා කිරීම හා අමතර කොටස් යෙදීම වෙනුවෙන් මේ දක්වා නිර්දේශ ලබාදුන් ලංකා ගමනාගමන මණ්ඩලයේ ඇඹිලිපිටිය ඩිපෝවේ කළමණාකරන ඉංජිනේරු පී.එල්.එම්.සී.අබේරත්න මහතා ස්ථාන මාරු ලබා ඇති බැවින්, 2022 ජූලි මස සිට එම ධුරයේ කටයුතු කරනු ලබන දිස්නක කස්තුරිආරච්චි මහතා වෙතින් එම නිර්දේශ ලබා ගැනීම සඳහාත්,ඒ වෙනුවෙන් එම මහතා වෙත ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහාත්,නිර්දේශයක් ලබාදීමට පෙර රු:500.00ක මුදලක් හා නිර්දේශ ලබාදීමෙන් පසු රු500.00ක මුදලක් ගෙවීම් කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.05) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද උප කාර්යාල භූමිය මැණුම් කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද උප කාර්යාල භූමිය, ඉදිරිපසින් හා දෙපසින් මේ වන විට අනවසර පදිංචිකරුවන්ගේ ග්‍රහණයට ලක්ව ඇති බැවින් එම භූමිය මැණුම් කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>
එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පල්ලෙබැද්ද උප කාර්යාල භූමිය මැණුම් කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.06) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ලියන්ගස්තොට පොදු සුසාන භූමිය මැණුම් කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ලියන්ගස්තොට පොදු සුසාන භූමිය මැණුම් කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ලියන්ගස්තොට පොදු සුසාන භූමිය මැණුම් කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.07) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ සවි කර ඇති ආරක්ෂිත කැමරා පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහාත්,ක්‍රියා විරහිත වූ ආරක්ෂිත කැමරාව වෙනුවට නව කැමරාවක් සවි කිරීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ සවි කර ඇති ආරක්ෂිත කැමරා පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහාත්,ක්‍රියා විරහිත වූ ආරක්ෂිත කැමරාව වෙනුවට නව කැමරාවක් සවි කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ සවි කර ඇති ආරක්ෂිත කැමරා පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහාත්,ක්‍රියා විරහිත වූ ආරක්ෂිත කැමරාව වෙනුවට නව කැමරාවක් සවි කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.08) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 අංක දරණ ටිපර් රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 අංක දරණ ටිපර් රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 අංක දරණ ටිපර් රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා විසින් සභාගත කරන ලද යෝජනා.</u>

**06.09) ගමකන්ද පොදු සුසාන භූමියේ ඉදිකර ඇති ගොඩනැගිල්ලේ ඉදිරිපස කොටසේ වහලය සඳහා අවශ්‍ය අඩි 12 ප්‍රමාණයේ ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු 12ක් ලබාදීම සඳහාත්,ඒ වෙනුවෙන් සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>
ගමකන්ද පොදු සුසාන භූමියේ ඉදිකර ඇති ගොඩනැගිල්ලේ ඉදිරිපස කොටසේ වහලය සඳහා අවශ්‍ය අඩි 12 ප්‍රමාණයේ ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු 12ක් ලබාදීම සඳහාත්,ඒ වෙනුවෙන් සකස් කරන ලද රු:85,500.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, ගමකන්ද පොදු සුසාන භූමියේ ඉදිකර ඇති ගොඩනැගිල්ලේ ඉදිරිපස කොටසේ වහලය සඳහා අවශ්‍ය අඩි 12 ප්‍රමාණයේ ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු 12ක් ලබාදීම සඳහාත්,ඒ වෙනුවෙන් සකස් කරන ලද රු:85,500.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.10) බටතිඹුර DJ මිතුරෝ ක්‍රීඩා පිටියේ පැතිබැම්ම ඉදිකිරීම සඳහාත්,ඒ වෙනුවෙන් සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>
බටතිඹුර DJ මිතුරෝ ක්‍රීඩා පිටියේ පැතිබැම්ම ඉදිකිරීම සඳහාත්,ඒ වෙනුවෙන් සකස් කරන රු:1,980,000.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, බටතිඹුර DJ මිතුරෝ ක්‍රීඩා පිටියේ පැතිබැම්ම ඉදිකිරීම සඳහාත්,ඒ වෙනුවෙන් සකස් කරන ලද රු:1,980,000.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**07.කාරක සභා වාර්තා සලකා බැලීම.**

- **2022.08.12 වැනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>
2022.08.12 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>
2022.08.12 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීම සුදුසු බවට මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව 2022.08.12 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**08.මාසික ආදායම් වියදම් වාර්තා සලකා බැලීම.**

I. **2022 ජූලි මස ලැබීම් සාරාංශය.**
II. **2022 ජූලි මස ගෙවීම් සාරාංශය.**
III. **2022.07.31 දිනට අදායම් එකතු කිරීමේ ප්‍රගති වාර්තා.**
IV. **2022 ජූලි මස ලක්ෂ 10 ට වැඩි විදයම්.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>**
2022 ජූලි මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

**<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>**
එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 ජූලි මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**09.වෙනත් කරුණු**
නැත.

- **ගරු සභාපති තුමාගේ ස්තූති කථාව.**

අද දින මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය ලබා දුන් සියලුම ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් මාගේ ගෞරව පුර්වක ස්තූතිය පුදකර සිටිනවා.

2022.08.18 වන දින පැවති මහ සභාව මධ්‍යාහ්න 12.00ට පමණ නිමාවට පත් විය.

සුරන්ත වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.